(පහත දැක්වෙනුයේ HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ 2020 සංකලිත  වාර්ෂික වාර්තාවේ පිටු අංක 24 - 27 හි සඳහන් සභාපතිතුමියගේ පණිවිඩයේ සිංහල පරිවර්තනයක් පමණි.)

# සභාපතිතුමියගේ පණිවිඩය

## හිතවත් පාර්ශවකරුවනි,

2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරන අතර,  HNB ඇෂුවරන්ස් පොදු සමාගම රුපියල් මිලියන 1,175ක බදු පසු ලාභයක් වාර්තා කර ඇති බව සතුටින් දන්වා සිටිමි. එය 2019 වර්ෂයට වඩා 16% ක වැඩි වීමකි. HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ 19 වන වාර්ෂික මහා සභා රැස්වීමට මා ඔබව සාදරයෙන් පිළිගනිද්දී, මා මතකයට නැගෙන්නේ වෙනස් වීමේ වේගවත් බව සහ විෂය පථය මෙන්ම කැළඹිලි සහිත වෙනස්වීම් වලදී පවා සමහර මූලධර්ම නියතව පවතින බවයි.  ගෝලීය සැපයුම් දාමයන් බිඳීයාම හේතුවෙන් පෙර නොවූ විරූ පරිමාණයකින් ආර්ථික කැලැඹීමක් ඇති වී ඇති අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් අපගේ ජීවන රටාව, අප ජීවත් වන ආකාරය, උපයන සහ ඉගෙන ගන්නා අකාරයේ වෙනස්වීම බලපෑමක් ඇතිකරන ලදී. එසේ වුවත් මිනිස් ජීවිතයේ වටිනාකම, අන්තර් ක්‍රියාකාරිත්වයේ සහජ අවශ්‍යතාව, විශ්වාසය, විශ්වාසනීයත්වය මෙන්ම අනුවර්තනය වීමට හා නව්‍යකරණයට අපට ඇති හැකියාව ස්ථායීව පැවතුනි. මෙම වසරේ වාර්ෂික වාර්තාවේ තේමාව තුළින් පිළිබිඹු වන්නේ ශක්තිමත් සහ චිරස්ථායී සංවිධානයක් ගොඩනැගීම සඳහා ඉහත අංග මූලික වන බවයි.

### නව ප්‍රතිමාණයක් (A New Norm)

මගේ පෙර පණිවුඩයේ "අවිනිශ්චිතබව සම්මතය වේ" යනුවෙන් සඳහන් කළ ද, 2020 දී සිදු වූ පරිවර්තනයේ ප්‍රමාණය සිතා ගැනීම පවා දුෂ්කරය. මුල් පිටු වල ප්‍රධාන මාතෘකා බවට පත්ව තිබූ ඇමරිකා එක්සත් ජනපද-චීන සබඳතා, "බ්‍රෙක්සිට්" වැනි ගැටළු ඇතුළු පිටු වලට යොමු කරනු ලැබුවේ කොවිඩ් වසංගතයෙන් පැන නැගි මානුෂීය සහ ආර්ථික අර්බුදයන් පුළුල් ලෙස සැළකිල්ලට හේතු වූ බැවිනි. ඇස්තමේන්තුගත ගෝලීය වර්ධනය 3.5% කින් (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල) සංකෝචනය නිසා 2020 මුලදී අපේක්ෂා කළ ගෝලීය ප්‍රතිස්ථාපනය බිඳ වැටුණු අතර, ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO - International Labour Organisation) ඇස්තමේන්තු කර ඇත්තේ 2019 අර්බුදයට පෙර පැවති තත්වයට සාපේක්ෂව 2020 දී රැකියා මිලියන 114 ක් අහිමි වී ඇති බවයි. වෙනස්වන ඉල්ලුම හා සැපයුම් ගතිකතාවයන් මෙන්ම ගෝලීය සැපයුම් දාමයන් බිඳවැටීම නිසා ලෝක වෙළඳාම 9.2% කින් හැකිළී ගියේය. ලොව පුරා රජයන් සහනදායී අවස්ථාවන්ට අනුගත වී ඇති අතර, වඩාත් අහිතකර ප්‍රතිඵල ඇති වීම වලක්වා ගැනීම සඳහා පෙර නොවූ විරූ ප්‍රතිපත්තිමය සහන ලබා දීමට පියවර ගෙන ඇත. මේ හේතුවෙන් පොලී අනුපාත පෙර නොවූ ලෙස  අඩු මට්ටමක පවතින අතර 2021 වසරේදීද වර්තමාන මට්ටමේම පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. නව්‍ය එන්නත් හා ප්‍රතිකාර 2020 හි ප්‍රබලම ධනාත්මක සාධකය වී ඇති අතර,  ඒවා 2021 දී ගෝලීය වශයෙන් බෙදාහැරීම යථා තත්ත්වයට පත්වීමට සහ නව ප්‍රතිමානයට අනුගතවීමට සහාය වනු ඇතැයි පුළුල් ලෙස අපේක්ෂා කෙරේ.

කොවිඩ් වසංගතයේ බලපෑමට ලක් වූ ශ්‍රී ලංකා ආර්ථිකය ද 2020 දී 3.9% ක සෘණාත්මක වර්ධනයකින් අවසන් විය. දැඩි ආනයන පාලන ක්‍රියාමාර්ග, විදේශ විනිමය ගනුදෙනු සීමා කිරීම් සහ සේවක ප්‍රේෂණවල වර්ධනය සමඟ වෙළඳ හිඟය ඇමරිකානු ඩොලර් බිලියන 2 කින් පමණ අඩු කිරීමට සහාය විය. කෙසේ වෙතත්, 2020 අප්‍රේල් මාසයේ දී රු.200.47 ක අස්ථාවර මට්ටමක පැවතුණු රුපියල, වර්ෂ

අවසානයේ රු. 189.18 ක් විය. ආධාර සඳහා අයවැය ක්ෂේත්‍රයේ ඉඩ ප්‍රමාණවත් නොවුනත්, මහ බැංකුව විසින් 4% ක පොලියක් යටතේ ව්‍යාපාර සඳහා හඳුන්වා දුන් රුපියල් බිලියන 178 ක මුදල් උත්තේජක පැකේජය අහිතකර ලෙස බලපෑමට ලක් වූ ව්‍යාපාරයන්ට වර්ෂය තුළ නොනැසී රැඳීසිටීමට උපකාරී විය. බලපෑමට ලක් වූ ව්‍යාපාර වල ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම් සඳහා ණය විලම්බන කාලයක් ලබා දී එය 2021 මාර්තු 31 දක්වා දීර්ඝ කරන ලදී.

රාජ්‍ය ණය ශ්‍රේණිගතකිරීම පහත හෙළීම ප්‍රශ්නකාරිත්වයට මගපෑවේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සඳහා හදිසි අවශ්‍යතාවයක් උපුටා දක්වමිනි.

පෙර නොවූ විරූ දේශීය හා ගෝලීය ආර්ථික හා මානුෂීය ආතතීන්ගෙන් යුත් කාලපරිච්ඡේදයක පුරෝකථනය කල පොලී හා ප්‍රාග්ධන ගෙවීම්ද අයවැය හිඟයද 2021 දැක්ම කෙරෙහි උද්යෝගය හීන කරයි.

**අභියෝග ජය ගැනීම (Converging Challenges)**

පෙර නොවූ විරූ අවිනිශ්චිතතාවයකින් යුත් වත්මන් වර්ෂය තුළ අපගේ කාර්යය සාධනය, විවිධ වූ අභියෝග ජයගත් ආකාරය පිළිබඳ සාක්ෂියකි. අත්‍යවශ්‍ය සේවා කාණ්ඩය අතරට රක්ෂණ සේවාවද ඇතුළත් කිරීමත් සමඟම, අපගේ පළමු ප්‍රමුඛතාවය වූයේ අඛණ්ඩ සේවාවක් සැපයීමේදී ගණුදෙනුකරුවන් සමඟ සම්බන්ධව සිටින අපගේ කාර්යය මණ්ඩලයේ සෞඛ්‍ය සහ ආරක්ෂාව සුරක්ෂිත කිරීමයි. ඒකිනෙකා සමඟ කටයුතු කිරීම ද තර්ජනයක් වන හෙයින්, අපි පරිපාලනමය ක්‍රියාමාර්ගයන් කිහිපයක්ම හඳුන්වාදුන් අතර, මෙම ක්‍රියාවලිය පහසු කිරීම සඳහා හැකි තරම් යෙදුම් සඳහා ඩිජිටල් මාධ්‍යයන් භාවිතා කිරීමට ඉක්මණින් අනුගත වීමු. අපගේ පළමු අතථ්‍ය වාර්ෂික මහා සභා රැස්වීම (virtual Annual General Meeting), අප විසින් විසඳුම් සොයා ගත් ආකාරය පිළිබඳ එක් උදාහරණයක් වන අතර, සියලු ආයෝජකයින්ට සහභාගී වීමට හා ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන ලදී.

සංවර්ධනය වෙමින් පවතින අභියෝගයන්ට එරෙහිව කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් සමාගම විසින් ගනු ලැබූ තවත් මුලපිරීමක් වූයේ, සමීපව අධීක්ෂණය කරන ලද සංවිධානය පුරා විහිදුණු පිරිවැය තාර්කිකකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමයි. මෙම ව්‍යාපෘතිය යටතේ අප මෙම වසරේදී රුපියල් මිලියන 21 ක් ඉතිරි කර ඇති අතර 2021 දී තවත් රුපියල් මිලියන 43 ක ඉතිරියක් අපේක්ෂා කරන බව සතුටින් ප්‍රකාශ කරමි.

ආයතනයේ මූල්‍ය ස්ථායිතාව සහතික කිරීමේ අරමුණින් අධ්‍යක්ෂක මණ්ඩලය සිය අධීක්ෂණ කාර්යභාරය තීව්‍ර කර, කණ්ඩායම සමඟ වඩාත් සමීපව කටයුතු කළේය. ව්‍යාපාරික සැලසුම් ක්‍රියාත්මක කිරීම සමීපව අධීක්ෂණය කරන අතරතුර දී ඉස්මතු වන ව්‍යාපාරික පරිසරය හා සම්බන්ධ අභියෝග හා අවදානම් සමීපව අධීක්ෂණය කිරීමේ දී හා ප්‍රතිකර්ම වශයෙන් වූ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමේ දී අධ්‍යක්ෂක මණ්ඩල අනු කමිටු, විශේෂයෙන් අවදානම් කළමනාකරණ (Risk Management Committee) හා උපායමාර්ග සමාලෝචන කමිටු (Strategy Review Committee) වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.

සමාගම මුහුණ දුන් අනෙකුත් ගැටළු වලට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආර්ථික සාධක සහ අදාළ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන්ය. එයට 2020 දී අපගේ ආයෝජන ආදායමට සහ ජීවිත රක්ෂණ ලාභදායිතාවයට බලපෑ පොලී අනුපාත වල සැලකිය යුතු අඩු වීමත් ඇතුළත්විය.

අනෙකුත් කැපී පෙනෙන අභියෝගය වූයේ ආනයනය සීමා කිරීම් හේතුවෙන් මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ සංඛ්‍යාවේ සැලකිය යුතු අඩු වීමත් සහ මෝටර් රථ අමතර කොටස් වල මිල සැලකිය යුතු ලෙස

ඉහළ යාමත්ය. සමාජ දුරස්ථභාවය තබා ගැනීමේ ක්‍රියාමාර්ග වැනි සමාජීය සාධක අපගේ උපදේශක (Advisor) බලකායට අනාගත ගනුදෙනුකරුවන් සමඟ අන්‍යෝන්‍යව කටයුතු කිරීමට බාධා ඇති කළ අතර එය පිරිවැටුමට තවදුරටත් පීඩනයක් ඇති කළේය.

## ගිවිසුම් පිළිගැනීම (Upholding Convenants)

කොවිඩ් 19 හි පළමු රැල්ල අතරතුර, වේතන සහ ප්‍රතිලාභ අඩු නොකරන බවට අපගේ කාර්ය මණ්ඩලයට සහතිකයක් ලබා දීම මගින් ආයතනික ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය ස්ථාවරත්වය සපයන ලදී. වැදගත් ගිවිසුමක් ලෙස අප දුටු දේ ස්ථිර කිරීම මඟින්, ස්ථාපිත පටිපාටිවලට අනුකූලව අපගේ සේවකයින්ට වැටුප් වර්ධක, ප්‍රසාද දීමනා සහ වෙනත් ප්‍රතිලාභ ලැබුණු අතර, මෙම වාර්තාව ඔවුන්ගේ දිරිගන්වන සුළු කාර්යය සාධනය දක්වයි.

වර්ෂය තුළ "Great Place to Work" (වැඩ කිරීමට විශිෂ්ට ස්ථානයක්) සහතිකය ලබා ගත් සමාගම් 40 අතරට HNB ඇෂුවරන්ස් සමූහයද වේ. මෙය අපගේ ප්‍රගතිය සඳහා ඉවහල් වූ අපගේ සමූහයේ සහ එහි සේවකයින් අතර අන්‍යෝන්‍ය කැපවීම පිළිබඳ සාක්ෂියකි. HNB ඇෂුවරන්ස් පොදු සමාගම සහ HNBGI යන ආයතන දෙකම අපගේ රක්ෂණ ඔප්පු හිමියන්ට පළමුවෙන්ම රට වසා දැමූ කාලය තුළ ඔවුන්ගේ වාරික ගෙවීමට දීර්ඝ කරන ලද සහන කාලයක් ලබා දෙන ලදී. සහන කාලය තුළ අප සියලු හිමිකම් සහ ප්‍රතිලාභවලට ගරු කිරීම බව අපගේ රක්ෂණ ඔප්පු හිමියන් කෙරෙහි ඇති නොසැලෙන කැපවීමට සාක්ෂියකි.

## වටිනාකම මුදා හැරීම (Unlocking Value)

රට වසා දැමීමත්, වරින්වර ශාඛා වසා දැමීමත් සමඟ අඩපණ වූ ව්‍යාපාරික පරිසර පසුබිමක අපගේ පිරිවැටුම පසුගිය වසරට වඩා 5% කින් වර්ධනය විය. අපගේ කණ්ඩායම සාමූහිකව පෙළගැසී, වර්ධනය වීමට ඇති සෑම අවස්ථාවකින්ම උපරිම ප්‍රයෝජන ගැනීමට වෙහෙස මහන්සි වී වැඩ කළහ. HNB ඇෂුවරන්ස් සමූහයේ "Supreme Health Max" සහ "Super Critical Illness" යන සැලසුම් හා HNB ජෙනරල් ඉන්ෂුවරන්ස්හි "Pay As You Claim" සැලසුම එක්වීමත් සමඟ නිෂ්පාදන නවෝත්පාදනයන් අපගේ වර්ධනයට සහාය විය. අපගේ මුළු වත්කම් හා ශුද්ධ වත්කම් රුපියල් බිලියන 31.7 ක් සහ රු. බිලියන 8.2 කට පිළිවෙලින් 19% ක් සහ 22% කින් වර්ධනය විය.

අපගේ කාර්යය සාධනය කෙරෙහි බලපාන අවදානම් සාධක පිළිබඳ ගැඹුරු අවබෝධයක් සහිතව සිටීම මගින් පොලී අනුපාත පහත වැටීමෙන් ඉපයීම් මත ඇතිවන පීඩනය ප්‍රශස්ත ලෙස කළමනාකරණය කරන ලදී. කෙසේ වෙතත්, අපගේ පිරිවැටුම 6% කින් ඉහළ ගොස් තිබියදී ත් මෙම සාධක මෙන්ම 2020 දී අඩු පොලී අනුපාත වලට අනුව ජීවිත අරමුදලේ තක්සේරුව මගින් ඇතිවූ බලපෑමෙන් HNBA හි ඉපැයීමට සැලකිය යුතු ලෙස බලපෑමක් ඇතිවිය. සමස්තයක් ලෙස, HNBA සමූහයේ ඉපැයීම් 16% කින් වර්ධනය වී රු. මිලියන 1,175 ක් වීම මගින් ඵලදායිතාව ඉහළ නැංවීම, නවෝත්පාදන සහ හොඳ අවදානම් කළමනාකරණය පිළිබිඹු කරයි.

වසර ගණනාවක් තිස්සේ ලියාපදිංචි වී ඇති අපගේ කොටස් හිමියන්ට, අඛණ්ඩව ඉහළ කාර්යය සාධනයක් සහ ප්‍රතිලාභ ලබාදීමේ හැකියාව ලැබීමට අමතරව, එක් සාමාන්‍ය කොටසක් සාමාන්‍ය කොටස් තුනකට බෙදීම සම්බන්ධව අපගේ තීරණය නොවැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කිරීම මගින්, වත්මන් වර්ෂය තුළ අපගේ කොටස් හිමියන්ට ලැබී ඇති වඩාත්ම ආකර්ශනීය වාසිය හිමිවිය.

එනම් සමාගමේ ඔවුන්ගේ ආයෝජනයෙහි වටිනාකම මුදාහැරීමට ඇති හැකියාවයි. මෙම නිවේදනයත් සමඟ අපගේ කොටස්හි කාර්යය සාධනය සහ ද්‍රවශීලතාවය සැලකිය යුතු ලෙස වැඩි විය. 2019 වසර අවසන් වන විට රුපියල් බිලියන 6.9 ක් වූ HNBA සමූහයේ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය 2020 අවසානයේදී රුපියල් බිලියන 8.7 ක් වූ අතර, එය පෙර වසරට වඩා 27% ක වර්ධනයකි. කොටස්වල මුළු පිරිවැටුම 56% කින් ඉහළ ගොස් ඇති අතර 'HASU' වෙළඳපොළ දිනවලින් 97.6% ක් ගනුදෙනු විය. තවද, රැස්වීම පිළිබඳ නිවේදනයේ දන්වා ඇති පරිදි, මුළු ලාභාංශය රුපියල් මිලියන 420 ක් වන ලෙස, කොටසකට රුපියල් 2.80 ක පළමු සහ අවසාන ලාභාංශක් ඔබගේ අනුමැතිය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය නිර්දේශ කර ඇත.

මූල්‍ය ස්ථායිතාව පවත්වා ගැනීම ප්‍රධාන ප්‍රමුඛතාවයක් වූ අතර HNBA සහ HNBGI යන දෙඅංශයේම ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයන් (Capital Adequacy Ratio) 2019 දී පිළිවෙලින් 322% සහ 226% සිට 2020 දී 338% සහ 256% දක්වා වැඩි කිරීම පිළිබඳව අපි සතුටට පත් වෙමු. ඇතිවිය හැකි ගැටළු හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම සඳහා ද්‍රවශීලතාවය සමීපව නිරීක්ෂණය කරන ලදී.

මෙහෙයුම් පරිසරයෙහි කැපී පෙනෙන වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා ඉදිරි දැක්ම (Outlook) ධනාත්මකභාවයේ සිට ස්ථාවර තත්වය දක්වා වෙනස් කළ ද, HNBA සහ HNBGI, Fitch Ratings Lanka Ltd විසින් ලබාදෙන රක්ෂණ මූල්‍ය ශක්තිය ශ්‍රේණිගත කිරීම් (Insurer Financial Strength Rating) A (lka) ලෙස රඳවා ගෙන ඇත. මීට අමතරව, අපගේ පරිපාලක සමාගම වන Hatton National Bank PLC හී ශක්තිය මූල්‍ය ස්ථායිතාව සහතික කිරීමට, වර්ධනයට සහ ඵලදායිතාවයට බලපෑ ප්‍රධාන සාධකයන්ය.

සැලසුම් කර තිබූ ප්‍රජා ව්‍යාපෘති ඉටුකිරීම පිළිබඳව මම HNBA කණ්ඩායමට ප්‍රශංසා කරමි. දුර බැහැර ගම්මානවල පාසැල් වලට ජලය සැපයීම සඳහා පෙළගස්වන ලද ව්‍යාපෘති 6 ක් නිමකල අතර, ශ්‍රී ලංකා බිහිරි ක්‍රිකට් කණ්ඩායමේ අනුග්‍රහය අඛණ්ඩව පවත්වාගෙන ගියෙමු. වෛද්‍ය සඟරා සහ සෞඛ්‍ය ආශ්‍රිත සම්මන්ත්‍රණ සඳහා ප්‍රජා වෛද්‍යවරුන්ගේ විද්‍යාලයටද HNBA අනුග්‍රහය දැක්වීය.

## ඉදිරි දැක්ම (Outlook)

අපි වර්ෂය ආරම්භ කරන්නේ එන්නත්කරණ ඇරඹුමක් ඉදිරිපෙළ සේවකයින් එන්නත් කිරීම නිමාකර තිබීමත් යන සුබවාදී සටහනකිනි.

ලොව පුරා නව ප්‍රභේදයන් සහ නව රැළි මතු වීම සැලකිළීමත් වීමම නිසැකවම කාරණාවක් වන අතර එය දීර්ග ප්‍රතිසාධනයකට මගපෙන්වන්නකි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2021 ජනවාරි සඳහා වූ යාවත්කාලීන කිරීම තුල මෙම සුබවාදී බව පිළිබිඹු කරන්නේ 2020 ඔක්තෝම්බර් මාසයේ පුරෝකථනය 0.3% කින් ඉහළ නැංවීමත් සමඟ 2021 සඳහා ගෝලීය වර්ධනය අඩු මූලික අගයකින් වුවද 5.5% ක් වනු ඇති බවට පුරෝකථනය කිරීමත් මගිනි. මෙම යාවත්කාලීන කිරීම, වෛද්‍යමය මැදිහත් වීම් සඳහා ප්‍රවේශය, ප්‍රතිපත්තිමය සහයෝගයන් හී කාර්යය සාධනය, දේශයන් පුරා පැතිරයාම සහ අර්බුදයට ඇතුළු වන ව්‍යුහාත්මක ලක්ෂණ මත පදනම් වේ. මේ සාධක සම්බන්ධව ශ්‍රී ලංකාවේ ස්ථාවරය මත 2021 වසරේ ඉදිරි දැක්ම තීරණය වේ. මූල්‍ය ප්‍රතිපත්ති බොහෝ දුරට උපකාරී වන බැවින් සහ වසංගතය සම්බන්ධ ක්‍රියාමාර්ගයන් වර්තමානය වන විට තරමක් ඵලදායි වන හෙයින්ද, ව්‍යුහාත්මක ගැටලු තීරණාත්මක නිර්ණායක විය හැකිය. වර්ෂය ඉදිරියට යත්ම, අවශ්‍ය අවස්ථාවන්හිදී උපායමාර්ග නැවත සකස් කිරීම සඳහා, මේ සම්බන්ධ ඉහත සාධකයන් අපි අධීක්ෂණය කරන්නෙමු.

අපප ඊළඟ ප්‍රතිමානයට අනුව හැඩගැසෙමින් තාක්ෂණය මත පදනම්ව ඉලක්ක ගත සහ සුපරීක්ෂාකාරී වර්ධනයක් සඳහා සැළසුම් සකස් කර ඇත. විවිධාංගීකරණය වූ නව රක්ෂණ සැලසුම් දිරිගන්වන සුළු

අතර, “Pay As You Claim” රක්ෂණ ආවරණය මගින් තෙවන පාර්ශවීය රක්ෂණ වෙළඳපොළ පරිවර්තනයට සහාය වෙමින් ද, මෙම වෙළඳපොළ කාණ්ඩය සඳහා අවශ්‍ය ආරක්ෂිත ක්‍රමයන් ශක්තිමත් කිරීමෙන් ද, 2021 දී වර්ධනය සඳහා දායක වනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

2021 දී වර්ධනය වන වේගය මත ගොඩනැගී, වර්ධනයට සහ කාර්යය සාධනයට සහාය වීම සඳහා අපි අපගේ ක්‍රියාවලීන් සහ පද්ධති ශක්තිමත් කිරීම දිගටම කරගෙන යන්නෙමු. HNBGI සමාගම 2021 දී නව තාක්ෂණික පද්ධතියක් ක්‍රියාත්මක කරන අතර, එය වර්ධනයට සහ ඵලදායිතාවයට සහාය වනු ඇත. කර්මාන්තයට සැළකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කරන බැවින්, 2023 ජනවාරි මස 01 වන දින බලාත්මක තත්වයට පත්වන රක්ෂණ ගිවිසුම් සඳහා ප්‍රමිත අංක 17 (SLFRS 17) ට අනුගත වීමට සූදානම් වීම කෙරෙහි ද අවධානය යොමු කෙරේ. මෙහෙයුම කටයුතු ස්ථාවර වී ඇතත්, 2021 දී යථා තත්ත්වයට පත්වීමේ මාර්ගයේ ඇති විය හැකි අන්තරායන් සැලකිල්ලට ගෙන පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලය සෝදිසියෙන් සිටී.

**ඇගයීම් (Appreciations)**

මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා, රාජකාරි මට්ටමින් ඔබ්බට යමින්ගත් අපගේ තරුණ හා ජවසම්පන්න කණ්ඩායමේ ප්‍රසංසනීය උත්සාහයට ස්තූති කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය ද මා හා එක් වෙයි. බොහෝ දිනවල රැකියාවට යාම දෛනික අභියෝගයක් වූ බවත්, පවුල්වල සෞඛ්‍යය හා ආරක්ෂාව සම්බන්ධයෙන් දැඩි ලෙස කනස්සල්ලට පත්වූ අවස්ථා ඇති බවත් අපි දනිමු. HNBA සහ HNBGI කණ්ඩායම සීමාව ඉක්මවා අඛණ්ඩව සිහින දැකීම සහ ඔවුන්ගේ දැක්ම සම්පූර්ණ කිරීම අපි අතිශයින් අගය කරමු.

පළමු රැල්ලේ අවසාන භාගයේ දී තම දූරය භාරගෙන හානි වූ කාලය යථා තත්වයට පත්කර ගැනීම සඳහා සේනා පෙළගස්වමින් සිය කාර්යභාරය ඉදිරියට ගෙන යමින් ප්‍රශාන්ත ප්‍රනාන්දු මහතා විසින් සපයන ලද නායකත්වය අපි අගය කරමු. පසුගිය වසර 4 ක කාලය තුළ නායකත්වය සපයමින් සලසන ලද සේවය වෙනුවෙන් දීප්ති ලොකුආරච්චි මහතාට අපි ස්තූතිවන්ත වන අතර, ඔහුගේ අනාගත සාර්ථකත්වය ප්‍රාර්ථනා කරමු.

HNBA සමූහය කැළඹිළි සහිත වසරකට මුහුණ දුන්නේ කාර්ය මණ්ඩලයේ සහ අධ්‍යක්ෂක මණ්ඩලයේ වෑයම නිසා පමණක් නොව අපගේ නියෝජිතයින්, තැරැව්කරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන් සහ අප ක්‍රියාත්මක වන ප්‍රජාවන්ගේ අභිප්‍රායන් හේතුවෙනි. ඔබගේ අනුග්‍රහය සහ අප කෙරෙහි තබා ඇති විශ්වාසය අපි බෙහෙවින් අගය කරන අතර, නව ප්‍රතිමානයක් කරා අපි විශ්වාසයෙන් යුතුව ඉදිරියට යන විට අපගේ සබඳතා පුළුල් කිරීමට අපේක්ෂා කරමු.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් සපයනු ලබන සහාය සහ මග පෙන්වීම පිළිබඳව මාගේ ප්‍රශංසාව ප්‍රකාශ කළ යුතුය. අවසාන වශයෙන්, HNBA පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහාත් සහ කාර්යය සාධනයට සහ වර්ධනයට සහාය වන සමතුලිතතාවයක් ප්‍රවේශමෙන් පවත්වා ගැනීම සඳහාත් අසීරු වර්ෂයකදී එක්ව කටයුතු කරමින් දක්වන ලද නොසැලෙන සහයෝගයට මාගේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්ට මම ස්තූතිවන්ත වෙමි.

රෝස් කුරේ,
සභාපතිතුමිය

2021 පෙබරවාරි 19

කොළඹ

(පහත දැක්වෙනුයේ HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ 2020 සංකලිත වාර්ෂික වාර්තාවේ පිටු අංක 28-31 හි සදහන් ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ විවරණයේ සිංහල පරිවර්තනයක් පමණි.)

## ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ විවරණය

## හිතවත් පාර්ශවකරුවනි,

රු. බිලියන 1.18 ක ලාභයක් ලබා දෙමින් නව ඉදිරි දර්ශනයක් ඇතිකර ගනිමින් විවිධාකාර වූ එකිනෙකට සම්බන්ධ වූ අභියෝග වලට අනුගත වීමට ඉගෙන ගනිමින් 2020 අභියෝගාත්මක වසරෙහි බාධක පිරි මගෙහි අපි සාර්ථකව ගමන් කර ඇති බව HNB ඇෂුවරන්ස් හි ප්‍රධාන විධායක නිලධාරි වශයෙන් මගේ පළමු පණිවුඩයෙන් මම ඉතා සතුටින් ප්‍රකාශ කරමි. නම්‍යශීලී ආකල්ප, ක්ෂණිකව ක්‍රියාත්මකවීම් සහ ඩිජිටල්කරණයේ ප්‍රගතිය සඳහා හේතු වූ මූලික කාරණා වන අතර අපගේ මූලික අවධානය යොමු වූයේ පුද්ගලයන්ය. ඒ ඔවුන් අවදානමට ලක්ව සිටි බැවිනි. මෙම සංක්‍රාන්තිය තුළ කණ්ඩායමේ කොටසක් බවට පත් වී සිටීම පැහැදිලි වාසියක් වූ අතර පළමු දිනයේ සිටම ක්‍රියාත්මක වීමට හැකිවන ආකාරයේ ශක්තිමත් බැඳීමක් ඒ වන විටත් අප සතුව තිබුණි.

### පළමුව ජනතාව (Putting People First)

ප්‍රදේශ වසා දැමීම සහ සමාජ දුරස්ථභාවය වැනි පියවර ගැනීම තුළ වුවද දළ ලිඛිත රක්ෂණ වාරික (Gross Wrritten Premium) ඉලක්ක වැනි කිරීමට අපහසු ලෙස පෙනෙන කාරණා ලඟාකර ගැනීම වැනි අභියෝග වලට ඉහලින් අප නැගී සිටි අවස්ථාවන් සැබවින්ම ආශ්චර්යමත්ය. සේවකයන්ට ශක්තිය ලබා දීම අපගේ ප්‍රමුඛතාව වූ අතර අප අත්‍යවශ්‍ය සේවාවක් වශයෙන් ප්‍රකාශයට පත්වවීමත් සමඟ නිරෝදායන ඇඳිරිනීතිය තුළ රැකියාවට පැමිණීම හෝ විවිධ සැපයුම් ලබා ගැනීම පවා අවදානමක් වූ අවස්ථාවක අපගේ කාර්යාල විවෘත කර තැබීම අවශ්‍ය විය. වේතන, ප්‍රතිලාභ සහ රැකියා සම්බන්ධයෙන් මුලින්ම සැක දුරු කරමින් ලබා දී තිබුණ අස්වැසිල්ල සහ දුරස්ථව කාර්යාල කටයුතු කිරීම සඳහා උපාංග, ඩිජිටල් වේදිකාවන් සහ පුහුණුව ලබාදීම තුළින් කාර්යසාධනය බලගැන්වීම සිදුකෙරිණි. අපේක්ෂාවන් පැහැදිළිව ප්‍රකාශ කිරීම තුළ අපගේ නිවසේ සිට වැඩ කිරීමේ ප්‍රතිපත්ති විධිමත් කිරීම තුලින් දැනටත් අපි කණ්ඩායම් දෙකක් ලෙස කටයුතු කරමු. ඒ අනුව අප සේවා ස්ථානය නව සෞඛ්‍ය සහ ආරක්ෂක ක්‍රියාපිළිවෙල සඳහා අනුගත වී තිබෙන අතර දෘශ්‍ය මාධ්‍ය සහ ප්‍රශස්ත ලෙස නිසි වේලාවට සිදු කරන විකාශයන් තුළින් යහපත් සනීපාරක්ෂක පුරුදු නිරන්තරයෙන් ශක්තිමත් කරමින් අපි කටයුතු කරමු.

අපගේ ගනුදෙනුකරුවන්ට ආරක්ෂිතව අප සමඟ කටයුතු කිරීමට හැකි බව තහවුරු කිරීම අපගේ නව ප්‍රමුඛතාවක් වූ අතර අපගේ කාර්ය මණ්ඩලයේ සියළු දෙනාම එම කාරණයට ප්‍රමුඛතාව දෙති. අපගේ ඇමතුම් මධ්‍යස්ථාන සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක කිරීමට මුල් අවස්ථාවේදීම ගත් පියවරයන්ද ගෙවීම් ඇතුළු ව පුළුල් පරාසයක ඩිජිටල් සහ ජංගම විසඳුම් ලබා දීමටද කටයුතු කර තිබේ. ප්‍රදේශ වසා දැමීම නිසා අපගේ පාරිභෝගිකයන්ට ගෙවීම් කිරීම සඳහා දින 90 ක සහන කාලයක් ලබා දෙන ලදී. පාරිභෝගිකයන් කේන්ද්‍ර කරගත් නවෝත්පාදක නිමැවුම් සහ ක්‍රියාවලි තුලින් අප ඔවුන්ගේ උවමනාවන් සාකල්‍ය ක්‍රියාමාර්ග හරහා ආමන්ත්‍රණය කරන නිසා එය අපගේ වර්ධනයට අනුබල දෙන ප්‍රධාන සාධකයක් වී තිබේ. ඒ අනුව “Supreme Health Max” සහ “Super Critical illness” යන ජීවිත රක්ෂණ ආවරණ සහ සාමාන්‍ය රක්ෂණය සඳහා “Pay as You Claim” සැලසුමත් පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව අප දැක්වූ ප්‍රතිචාර වන අතර ඒ තුලින් හඳුනාගත් වෙළෙඳපොල තුළ එක් එක් අංශ සඳහා වැඩි යොමුවීමක් සිදුවිය. වසංගතය ආරම්භ වන අවස්ථාව වන විට වසංගත යන්න සෞඛ්‍ය රක්ෂණ තුළ අන්තර්ගතව නොතිබුණත් කොවිඩ් 19 ට අදාල රක්ෂණ හිමිකම් පෑම් සඳහා සානුකම්පිත වන්දි

ලබාදෙන ලදී. අපගේ බෙදාහැරීමේ ජාලය තුළ රක්ෂණ උපදේශකයන් විශාල භූමිකාවක යෙදෙන අතර ප්‍රදේශ වසා දැමීම තුළ ඔවුන්ට නව වාරික උත්පාදනයට නොහැකි වූ තත්ත්වයක් තුළ ඔවුන්ගේ පැවැත්ම සඳහා කොමිස් අත්තිකාරම් ලබා දීමෙන් HNBA ඔවුන්ට තම සහාය දක්වා තිබේ. මෙම කාල සීමාව තුළ ඩිජිටල් අඩිතාලමක් මත කටයුතු කිරීම සඳහා අමතර පුහුණුවක් ද ලබා දුන් අතර දැන් ඔවුහු එම මඟ ඔස්සේ තම විකිණුම් කටයුතු ආරම්භ කරමින් එම පරිවර්තනයන්ට සාර්ථකව මුහුණ දීමට සමත් වී සිටිති. අප පරිශ්‍රය තුළ සිටින බාහිර පාර්ශවකරුවන්ට ද ඔවුන්ගේ කොන්ත්‍රාත් පිළිබඳවත් ඔවුන්ගේ සේවකයන්ගේ වේතන සහ ප්‍රතිලාභ ආරක්ෂා කරන බවටත් තහවුරුවක් ලබා දී තිබේ. ඊට අමතරව සෞඛ්‍ය සහ ආරක්ෂණ ප්‍රමිතීන් නිසි ලෙස පවත්වා ගැනීම සඳහා අපගේ ආයතනයේ පැවැත්වෙන සෞඛ්‍ය සහ ආරක්ෂණ වැඩසටහන් වලට ද ඔවුන්ව සම්බන්ධ කර තිබේ. එසේම අප අපගේ සැළසුම් කරන ලද ව්‍යාපෘති සම්පූර්ණ කිරීමෙන් ප්‍රජාව තුළද ආයෝජනය කර තිබේ.

## අනුගත වීම සහ පරිණාමය (Adopting & Evolving)

නව සම්මතයන් ජයග්‍රහණය කිරීම සඳහා ජීවන රටාව දැඩි වෙනසක් හා ඉහළ අවිනිශ්චිතතාවන්වලට සහ සුසමාදර්ශයන්ගේ වෙනස්කම් සඳහා අනුගත වීම අත්‍යවශ්‍ය කාරණයකි. ඩිජිටල්කරණය වඩා වේගවත් කරන ලද අතර අප සේවකයන් අත්‍ය කාර්යාලයක් තුල ප්‍රශස්ත ලෙස වැඩ කිරීමට පුහුණු කෙරිනි. සේවා ස්ථානයෙහි ඇති කරන ලද වෙනස්කම් වන “hot desk” සංකල්පය සහ වැඩ බෙදා වෙන්කිරීමත් නිවසේ සිට වැඩකිරීම සහ අතථ්‍ය රැස්වීම් එක් රැයකින් සාමාන්‍ය පුරුද්දක් බවට පත්වීම තුලින් එදිනෙදා මුහුණ දෙන ගැටළු විසඳීමට පහසුවක් විය. සේවකයන්ගේ සහභාගිත්වය දුරස්ථව වැඩ කරන පරිසරයක ප්‍රධාන වශයෙන් අවධානයට පාත්‍ර වූ කාරණයක් වන අතර අපගේ කණ්ඩායම අභිප්‍රේරණයක් සහිතව උද්යෝගිමත්ව තබා ගැනීම සඳහා අපගේ මානව සම්පත් අංශය විසින් ලබා දුන් නායකත්වය අගය කළ යුතුය.

අප අපගේ කාර්ය සාධනය ලබා දීමේ දී ඉතාමත් ප්‍රවේශමෙන් ව්‍යාපාර සහ ජනතාවගේ ප්‍රමුඛතාවන් සමබර කරමින් කටයුතු කරන විට නායකත්වය තවත් මූලික පැතිකඩක් ආවරණය කරයි. දිනපතා පැවැත්වූ විධායක කාරක සභා රැස්වීම් සහ ඉහළ මට්ටමේ තීරණ ගන්නන් ගෙන් සමන්විතව ඇතිකළ කොවිඩ් - 19 කාර්ය සාධක බලකායෙන් අපට මුහුණ දීමට සිදුවිය හැකි බාධක සහ අපගේ දිගුකාලීන දෘෂ්ටිය තුළ අදාළ අවස්ථාවන් හඳුනා ගැනීමට අපට හැකි විය. නවෝත්පාදන සංකල්ප වල සිට වෙළෙඳපොළ දක්වා ගෙන යාම කෙටි කාලයක දී සිදු කිරීමට අවශ්‍ය වූයේ අවිනිශ්චිතතාව විසින් ඇති කරන ලද බලවත් ඕනෑකම නිසා වූ අතර ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම අවශ්‍ය විය. අපගේ සාමූහික අරමුණු ළඟාකර ගැනීමට අප අඛණ්ඩව අතථ්‍ය හෝ මිශ්‍ර ආකාරයට කටයුතු කිරීම තුළින් සහයෝගිතාව අඛණ්ඩව වර්ධනය විය. අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු විසින් සිදුකරන අධීක්ෂණය තීව්‍ර කල අතර රැස්වීම් පවත්වන වාර ගණන වැඩිකිරීම හේතුවෙන් සාධනීය ලෙස අභියෝග ප්‍රතිපෝෂණයක් ලබා දීමටත් මුහුණ දිමට සිදුවිය හැකි බාධාවන් මඟහැර ගැනීමටත් හැකියාව ලැබුණි.

## තාක්ෂණය වැළඳගැනීම (Embracing Technology)

පැවැත්ම සහ වර්ධනය තාක්ෂණය මත තීරණය වන අතර අප අනාගත ව්‍යාපෘති සඳහා සැළසුම් සහිතව වසර කිහිපයකට පෙර අපගේ ගමන ආරම්භ කිරීම අපගේ වාසනාවකි. වර්ධනය වැඩිකිරීම සඳහා වන ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම පාරිභෝගිකයන් ඩිජිටල් තාක්ෂණය වැළඳ ගැනීමට උත්සුක වීම මත වේගවත් කරන ලදි. අපගේ ඉදිරි පෙළ ක්‍රියාකාරිත්වයන් ඩිජිටල්කරණය කිරීම සම්බන්ධයෙන් අප කටයුතු කරන විට අපගේ උපදේශකයන්ට යෝජනාවන් ටැබ් පදනම් කරගත් යෙදවුම් හරහා නිකුත් කිරිමට හැකිවීමත් ගනුදෙනුකරුවන්ට ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ඒවා ලබා

ගැනීමට හැකිවීමත් නිසා ඔවුන්ව අඛණ්ඩව සම්බන්ධකර තබා ගැනීමටත් ඒ සඳහා යන කාලය වේගවත් කිරීමටත් ඒ තුලින් කඩදාසි රහිත කාර්යාලයක් බවට පරිවර්තනය වීමත් සිදුවිය.

නිවසේ සිට වැඩ කිරීමට සිදුවීම නිසා ඇතිවූ අභියෝග වලට අනුගත වෙමින් තොරතුරු වත්කම් ආරක්ෂා කිරීම සඳහ ආරක්ෂණය සම්බන්ධ නීති මාලාවන් තහවුරු කරන අතරම ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සඳහා අවශ්‍ය පියවර ගැනීම සඳහා ද යෝජනා බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් තොරතුරු ලබා දෙන අතර  අපගේ ඇමතුම් මධ්‍යස්ථානවල මෙහෙයුම් ද ප්‍රශස්ථ සේවාවක් ලබා දීම සඳහා වැඩිදියුණු කර තිබේ.

අනාථ්‍ය වැඩකරන ස්ථානයක් දක්වා වන පරිවර්තනය සඳහා අපගේ සේවකයන් සහ නියෝජිතයන් සන්නද්ධ කිරීම සඳහා සැලකිය යුතු ආයෝජනයක් සිදුවිය. නිවසේ සිට වැඩකිරීම යථාර්ථයක් බවට පත්කිරීම සඳහා ඩෙස්ක්ටොප් පරිගණයක භාවිතා කරන අයට ලැප්ටොප් පරිගණක ලබා දීමත් ජංගම වයි ෆයි රවුටර් ලබා දීමත්  සිදුවිය. ආයතනය සතු තොරතුරු වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා ඇති විය හැකි තර්ජනයන් අවම කර ගැනීම සඳහා සයිබර් ආරක්ෂාව  තර කිරීමටත් ආයෝජනය කරන ලදී. මෙම ආයෝජන මගින් සහයෝගීතාව සඳහා නව පරිසර පද්ධති බිහිකර තිබෙන අතර එළඹෙන වසර තුළ ප්‍රතිලාභ වැඩි කිරීමට බලාපොරොත්තු වේ.

## අවිනිශ්චිතතාව මැද කාර්ය සාධනය (Performance Amidst Uncertainty)

අභියෝගාත්මක ව්‍යාපාර පරිසරයක් තුළ 5% ක වර්ධනයක් සහිතව රු. බිලියන 10.4 ක දළ ලිඛිත රක්ෂණ වාරික (Gross Written Premium) සනිටුහන් කරමින් 2020 වසර තුළ HNB ඇෂුවරන්ස් ඉතා වැදගත් සන්ධිස්ථානයක් පසු කර තිබේ. ආයෝජන කළඹ වර්ධනය සහ කල් පිරීම සඳහා දීර්ඝ කාලයක් ගතවන අරමුදල් ආකර්ශනීය අනුපාත වල තැබීම නිසා  පොළී අනුපාත අඩු වුවද එම වසර තුළ පොළී ආදායම  රු. බිලියන 2.5 ක් දක්වා 11% කින් වර්ධනය විය. රක්ෂණ වාරික ප්‍රතිරක්ෂකයන්ට නැවත පවරා දිමෙන් පසුව සහ උපයා නොගත් රක්ෂණ වාරිකවල ශුද්ධ වෙනස් කිරීමෙන් පසුව ශුද්ධ ආදායම 6 %  ක වර්ධනයක් පෙන්නුම්  කරමින් රු. බිලියන 11.6 ක් දක්වා වර්ධනය විය. පොළී අනුපාත අඩුවීම නිසා ජීවිත රක්ෂණ සංචිතයේ ගිවිසුම්ගත වගකීම් වල වෙනස්කම් 19% කින් වැඩිවීම සහ වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් 9% කින් වැඩිවීම නිසා ලාභදායීත්වයට බලපෑමක් එල්ල විය.

ව්‍යාපාර වර්ධනය විසින් මෙහෙයවනු ලැබ මූල්‍ය ආයෝජන රු. බිලියන 26.4ක් දක්වා 24% කින් වැඩිවූ අතර මුළු වත්කම් ප්‍රමාණය රු. බිලියන 31.7 ක් දක්වා 19% කින් වර්ධනය විය. වගකීම් රු. බිලියන 23.5 දක්වා 18% කින් වර්ධනය වූ  අතර ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් වගකීම් 18% කින් සහ 15% කින් පිළිවෙලින් රු. බිලියන 17.1 සහ රු. බිලියන 3.3 ක් දක්වා වසර අවසානයේ දී වර්ධනය විය. දූරදර්ශී කලමනාකාරිත්වය තුළින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (Capital Adequacy Ratio)  2019 තිබූ 322% සිට 338% දක්වා ජීවිත රක්ෂණ සඳහාත් සාමාන්‍ය රක්ෂණය සඳහා 2019 තිබූ 226% , 256% දක්වාත් වර්ධනය වීමට වසර අවසානයේ අපගේ ප්‍රවේශම්කාරී වර්ධනය සහ ස්ථාවර බවේ තුලනය හේතුවිය. බොහෝ ආයතනවල ඇගයීම් පහළ යන තත්ත්වයක ස්ථාවර මට්ටමක සිටිමින් රක්ෂණ මූල්‍ය ස්ථාවරතා ඇගයීම A (lka) ලෙස තබා ගැනිමට හැකිවීම පිළිබඳව අපි සතුටු වෙමු.

## කොටස් හිමිකරුවන් සඳහා වටිනාකම (Value to Shareholder)

2020 වසර අවසානයේ රුපියල් බිලියන 8.7 ක් වූ HNB ඇෂුවරන්ස් PLC හි වෙළෙඳපොල ප්‍රාග්ධනිකරණ වටිනාකමෙහි 27%  ක වර්ධනය රුපියල්  මිලියන 1.8 ක කොටස් හිමිකරු වටිනාකමක් වැඩි කර ඇති බව ඉතා සතුටින් දන්වා සිටිමි. අඩුවෙමින් පැවති පොළී අනුපාත මගින් කොටස් වෙළෙඳපොල පිළිබද උනන්දුව වර්ධනය වීමත් සමග සියළු කොටස් මිල දර්ශකය 10.5% කින් වර්ධනය වූ අතර අප සමාගමේ

කොටස් එම වර්ධනයද අභිබවා යාමට සමත් විය. 2020 දෙසැම්බර් මස සිට ක්‍රියාත්මක වූ 1:3 අනුපාතයට වූ කොටස් විභේදනය පැහැදිලි දායකත්ව සාධකයක් වූ අතර එමගින් කොටස් සඳහා අවශ්‍ය ද්‍රවශීලතාව ඇති කරන ලදී. මිල ඉපයුම් අනුපාතය සහ පොත් වටිනාකමට මිල සඳහා වූ 7.43 සහ 1.1 සමාජයට සහ සේවාදායකයන්ට ලබා දිය හැකි වටිනාකමේ නව විභවයක් පෙන්නුම් කරයි. පාලක මණ්ඩලය විසින් එක් කොටසකට පළමු සහ අවසාන ලාභාංශය ලෙස රුපියල් 2.80 ක් ප්‍රකාශයට පත් කර තිබෙන අතර ඒය එළඹෙන වාර්ෂික මහ සභා රැස්වීමේ දී කොටස් කරුවන් විසින් අනුමත කළ යුතුය.

## අපගේ අනාගතය හැඩ ගැස්වීම (Shaping Our Future)

පවතින වසංගත තත්ත්වය තුළ ශක්තිමත් සහ වේගවත් ලෙස ප්‍රකෘතියට පත්වීමේ බලාපොරොත්තු වලට බාධා කරමින් නව ප්‍රතිරෝධයන් සහ රැළි අඛණ්ඩව ක්‍රියාත්මක වුවත් සියළු දෙනා බලා සිටි එන්නත් දැන් ලෝකයේ බොහෝ කොටස් වෙත ළඟා වෙමින් පවතියි. කෙසේ වෙතත් 2020 ඇතිවූ වේගවත් පරිණාමයන් එම වසර ආරම්භයේ අපි සූදානම්ව නොසිටි අවිනිශ්චිතතාවන්ට අප ව සූදානම් කර තිබේ. නව සංකල්ප යටතේ කටයුතු කිරීමට අපගේ ආකල්පද සකස් වූ අතර අපගේ ගනුදෙනුකරුවන් මෙන්ම ව්‍යාපාර හවුල්කරුවන් ද අපගේ එම ගමන පුරා අප සමග එක්ව කටයුතු කළහ. අපගේ ව්‍යාපාර පරිසරය තුළ පැමිණිය හැකි තර්ජන කළමනාකරණය කිරීමට අපට ඇති හැකියාව තක්සේරු කිරීම සඳහා අප අවදානම තක්සේරු කිරීමත් ආතති පරීක්ෂණ (Stress Testing) පුළුල් කිරීමත් අඛණ්ඩව සිදු කරමු. සෑම අර්බුධයක් සමඟම අවස්ථාවන් ද නිර්මාණය වේ. අපගේ ගෘහස්ථ ජාලය අපගේ මව් සමාගමේ සහායත් අපගේ වර්ධනයට ප්‍රධාන පිටුවහලක් වූ අතර බැංකු රක්ෂණය හරහා කණ්ඩායමක් ලෙස සමීපව අප කටයුතු කර තිබේ. ඉදිරියට ගමන් කිරීමේ දී මෙය අපගේ අවධානය යොමුවන ප්‍රධාන ක්ෂේත්‍රයක් වනු ඇත.

වෙනස්කම් සඳහා නවෝත්පාදනයන් සහිතව ප්‍රතිචාර දැක්වීමට පසුගිය වසර විසින් අපගේ දෘෂ්ටිය සහ බුද්ධිය මුවහත් කර තිබේ. අපහැදිළි අනාගතය වෙත අප යන ගමනේ දී ශක්තිමත් නවෝත්පාදක රාමුව අපට මනා සහායක් දක්වයි. සෑම විටම ජනතාව කෙරෙහි පවතින අපගේ පක්ෂපාතිත්වය තුළ ඩිජිටල්කරණය ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරන අතර ශක්තිමත් සහ චිරස්ථායී අපේක්ෂා සහිත අප රක්ෂණ සමාගමට එය අඛණ්ඩව මග පෙන්වනු ඇත.

## ස්තුතිය (Acknowledments)

තීරණ ක්‍රියාත්මක කිරීම වෙත තම අවධානය යොමු කෙරෙන උද්දීප්ත වූ වැඩකරන ස්ථානයක් ඇති කිරීම සඳහා වූ සීමා කිරීම් වලට සහ යහපාලනයන් සඳහා සකස් කර තිබෙන ස්ථාවර ව්‍යුහයන් සමඟ සම්බන්ධ වෙමින් ධනාත්මක චින්තනයක් සහ ජෛව බලයක් සහිත තරුණ කණ්ඩායමකට නායකත්වය දීමට හැකිවීම මා ලැබූ භාග්‍යක් කොට සළකමි. මෙම වාර්තාවේ සඳහන් කර තිබෙන කාර්යසාධනය ළඟාකර ගැනීම සඳහා ඔවුන් දැරූ උත්සාහයත් ඒ සම්බන්ධයෙන් වූ ඔවුන්ගේ අදහසුත් මම ඉතා අගය කොට සළකමි. අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් වන අතර එම මණ්ඩලය වෙත ප්‍රවේශ වීමට ඇති හැකියාව වැඩි කිරීම තුළ HNBA කණ්ඩායමේ කටයුතු සම්බන්ධයෙන් ඔවුන්ගේ වැඩිවූ අවධානය, ක්ෂණික තීරණ ගැනීමටත්, නිසි ලෙස සම්පත් වෙන් කර ගැනීමටත් බෙහෙවින් ඉවහල් විය. මාගේ මුල් වසර තුළ මෙම ගෞරවාන්විත සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් ඔවුන්ගෙන් මට ලැබුණ සහාය මිල කළ නොහැකිය.

තම අවදානම් කළමනාකරණය කර ගැනීම සඳහා අප වෙත අඛණ්ඩව විශ්වාසය තැබූ ගනුදෙනුකරුවන්ට මම මාගේ ස්තූතිය පුදකරන අතර තවදුරටත් ඔවුන්ගේ කටයුතු සමඟ සම්බන්ධ වීම සඳහා පුළුල් පරාසයක විසඳුම් ලබාදීමට අපි අපේක්ෂා කරමු. අපගේ ව්‍යාපාර පාර්ශ්වකරුවන්ට අපගේ ගමනට දැක්වූ අඛණ්ඩ සහාය වෙනුවෙන් මාගේ ස්තූතිය පිරිනමමි. ඔවුන්ගේ සාමූහික සහාය තුළින් අපට ලබා දුන් ශක්තිය මම අගය කරමි. අපගේ මව් සමාගම වන හැටන් නැෂනල් බැංකුවට සහ HNB ඇෂුවරන්ස් වෙත තැබූ විශ්වාසය තුළින් කොටස් හිමිකරුවන් අප වෙත දැක්වූ සහායටත් මම මාගේ ස්තූතිය පිරිනමන අතර අපගේ පාර්ශ්වකරුවන්ට වැඩි වටිනාකමක් ඇති කිරීම සඳහා ඔවුන්ගේ අඛණ්ඩ විශ්වාසය තවදුරටත් ලැබේ යැයි අපේක්ෂා කරමි.

ප්‍රසන්න ප්‍රනාන්දු
ප්‍රධාන විධායක නිළධාරි

2021 පෙබරවාරි 19

# HNB ඇෂුවරන්ස් PLC
## මූල්‍ය තත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට, | සමූහය 2020 | සමූහය 2019 | සමාගම 2020 | සමාගම 2019 |
|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 169,788 | 162,371 | 116,740 | 111,202 |
| කල්බදු වත්කම් භාවිතා කිරීමේ අයිතිය | 394,437 | 343,737 | 380,105 | 325,572 |
| අස්පෘෂ්‍ය වත්කම් | 68,858 | 51,787 | 62,240 | 49,830 |
| විලම්භිත බදු වත්කම් | 738,721 | 1,009,711 | 725,255 | 1,000,673 |
| මූල්‍ය ආයෝජන | 26,366,608 | 21,202,074 | 22,075,265 | 17,777,410 |
| ආයෝජන - පරිපාලිත සමාගම | - | - | 1,150,000 | 1,150,000 |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය | 379,736 | 325,307 | 379,736 | 325,307 |
| ලැබිය යුතු ප්‍රති රක්ෂණ | 771,776 | 645,411 | 172,699 | 144,715 |
| ලැබිය යුතු රක්ෂණ වාරික | 1,111,594 | 946,650 | 4,988 | 9,458 |
| වෙනත් වත්කම් | 864,414 | 933,633 | 582,321 | 625,499 |
| රක්ෂණ ගිවිසුම් – විලම්භිත වියදම් | 163,619 | 138,622 | - | - |
| මුදල් සහ මුදල් සමානතා | 711,111 | 865,843 | 393,522 | 632,712 |
| **මුළු වත්කම්** | **31,740,662** | **26,625,146** | **26,042,871** | **22,152,378** |
| **හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | | | | |
| **මව් සමාගමේ මුළු හිමිකරු ප්‍රාග්ධනය** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 1,171,875 | 1,171,875 | 1,171,875 | 1,171,875 |
| රඳවාගත් ලාභ | 5,841,032 | 4,965,809 | 4,968,314 | 4,544,369 |
| විකිණීම සඳහා වර්ගීකරණය කරන ලද ආයෝජනයන්හි සංචිත | 93,754 | 24,801 | 15,626 | 9,881 |
| වෙනත් සංචිත | (51,520) | (6,525) | (33,916) | (6,514) |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | 757,933 | 177,228 | 757,933 | 177,228 |
| සීමිත නියාමන සංචිතය | 381,156 | 381,156 | 381,156 | 381,156 |
| **මව් සමාගමේ මුළු හිමිකරු ප්‍රාග්ධනය** | 8,194,230 | 6,714,344 | 7,260,988 | 6,277,995 |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය** | 8,194,230 | 6,714,344 | 7,260,988 | 6,277,995 |
| **වගකීම්** | | | | |
| රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත රක්ෂණ | 17,064,089 | 14,464,534 | 17,064,089 | 14,464,534 |
| රක්ෂණ ප්‍රතිපාදන - සාමාන්‍ය රක්ෂණ | 3,309,149 | 2,871,416 | - | - |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | 254,438 | 167,118 | 150,729 | 100,076 |
| වර්තමාන බදු වගකීම | 151,093 | 112,031 | 12,301 | 16,175 |
| ගෙවිය යුතු ප්‍රති රක්ෂණ | 700,105 | 540,652 | 290,916 | 125,151 |
| කල්බදු වගකීම් | 393,145 | 350,089 | 377,746 | 334,832 |
| වෙනත් වගකීම් | 1,550,108 | 1,274,326 | 832,198 | 802,565 |
| බැංකු අයිරාව | 124,305 | 130,636 | 53,904 | 31,050 |
| **මුළු වගකීම්** | 23,546,432 | 19,910,802 | 18,781,883 | 15,874,383 |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | **31,740,662** | **26,625,146** | **26,042,871** | **22,152,378** |

ඉහත මූල්‍ය තත්ව ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 194 හී ඇති විගණනය කරන ලද මූල්‍ය තත්ව ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා, | සමූහය | | සමාගම | | වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 2020 | 2019 | 2020 | 2019 | සමූහය | සමාගම |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | % | % |
| දළ ලේඛනගත රක්ෂණ වාරික | 10,398,992 | 9,942,757 | 5,487,039 | 5,175,044 | 5 | 6 |
| ප්‍රති රක්ෂකයන්ට කැපකළ වාරික | (1,307,978) | (1,312,881) | (265,164) | (240,974) | (0.37) | 10 |
| ශුද්ධ ලේඛනගත රක්ෂණ වාරික | 9,091,014 | 8,629,876 | 5,221,875 | 4,934,070 | 5 | 6 |
| නොඉපැයූ රක්ෂණ වාරිකවල සංචිතයේ ශුද්ධ වෙනස | (164,257) | (156,216) | - | - | 5 | - |
| **ඉපැයූ ශුද්ධ රක්ෂණ වාරික** | **8,926,757** | **8,473,660** | **5,221,875** | **4,934,070** | **5** | **6** |
| | | | | | | |
| **වෙනත් ආදායම්** | | | | | | |
| පොළී හා ලාභාංශ ආදායම | 2,493,317 | 2,248,926 | 2,125,362 | 1,949,467 | 11 | 9 |
| උපලබ්ධි වූ ශුද්ධ ලාභ | 53,634 | 92,856 | 44,909 | 70,000 | (42) | (36) |
| ශුද්ධ සාධාරණ අගය මත ලාභය/(අලාභය) | 17,696 | (8,826) | 12,987 | (6,370) | 300 | 304 |
| ගාස්තු සහ කොමිස් ආදායම් | 140,843 | 121,510 | 34,945 | 42,733 | 16 | (18) |
| වෙනත් ආදායම් | 14,970 | 16,196 | 5,747 | 2,965 | (8) | 94 |
| **මුළු වෙනත් ආදායම්** | **2,720,460** | **2,470,662** | **2,223,950** | **2,058,795** | **10** | **8** |
| **ශුද්ධ ආදායම** | **11,647,217** | **10,944,322** | **7,445,825** | **6,992,865** | **6** | **6** |
| | | | | | | |
| **ශුද්ධ ප්‍රතිලාභ, වන්දි සහ  වියදම්** | | | | | | |
| ශුද්ධ රක්ෂණ ප්‍රතිලාභ සහ ගෙවූ වන්දි | (3,398,239) | (3,524,768) | (1,428,349) | (1,325,145) | (4) | 8 |
| ශුද්ධ ගෙවියයුතු රක්ෂණ වන්දිවල වෙනස | (160,402) | (96,007) | (65,832) | (12,870) | 67 | 412 |
| ජීවිත රක්ෂණ සංචිතයේ ගිවිසුම්ගත වගකීම්හී වෙනස | (2,576,169) | (2,173,251) | (2,576,169) | (2,173,251) | 19 | 19 |
| වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් | (2,546,209) | (2,336,042) | (1,430,742) | (1,342,591) | 9 | 7 |
| ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත්කරගැනීමේ වියදම් | (1,235,446) | (1,288,068) | (888,527) | (959,550) | (4) | (7) |
| මූල්‍ය හා වෙනත් රක්ෂණ අදාළ වියදම් | (100,256) | (121,295) | (56,843) | (72,923) | (17) | (22) |
| **මුළු ප්‍රතිලාභ, වන්දි සහ වියදම්** | (10,016,721) | (9,539,431) | (6,446,462) | (5,886,330) | 5 | 10 |
| | | | | | | |
| **බදු පෙර ලාභය** | 1,630,496 | 1,404,891 | 999,363 | 1,106,535 | 16 | (10) |
| ආදායම් බදු | (455,273) | (394,663) | (275,418) | (279,826) | 15 | (2) |
| **වර්ෂය සඳහා වූ ලාභය** | **1,175,223** | **1,010,228** | **723,945** | **826,709** | **16** | **(12)** |
| | | | | | | |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | |
| **ලාභාලාභ සඳහා නැවත වර්ගීකරණය කරන ලද  හෝ වර්ගීකරණය වියහැකි අයිතම** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | 709,787 | 511,043 | 631,105 | 456,276 | 39 | 38 |
| - ආදායම් ප්‍රකාශයට මාරු කරන ලද  උපලබ්ධි වූ ලාභාලාභ | (53,106) | (92,836) | (44,655) | (68,751) | (43) | (35) |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | (580,705) | (379,095) | (580,705) | (379,095) | 53 | 53 |
| - ආශ්‍රිත බදු | (7,023) | (6,286) | - | - | 12 | - |
| **ලාභාලාභ සඳහා නැවත වර්ගීකරණය නොවන අයිතම** | | | | | | |
| ප්‍රතිමිනුම් මත ලාභ/(අලාභ) - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | (44,995) | (2,119) | (27,402) | (2,119) | 2,023 | 1,193 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම (බදු පසු)** | 23,958 | 30,707 | (21,657) | 6,311 | (22) | (443) |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | 1,199,181 | 1,040,935 | 702,288 | 833,020 | 15 | (16) |
| | | | | | | |
| **මුළු ලාභය :** | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු ලාභය | 1,175,223 | 1,010,228 | 723,945 | 826,709 | 16 | (12) |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - | - | - |
| **වර්ෂයේ මුළු ලාභය** | 1,175,223 | 1,010,228 | 723,945 | 826,709 | 16 | (12) |
| | | | | | | |
| **මුළු විස්තීරණ ආදායම :** | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු විස්තීරණ ආදායම | 1,199,181 | 1,040,935 | 702,288 | 833,020 | 15 | (16) |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - | - | - |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | 1,199,181 | 1,040,935 | 702,288 | 833,020 | 15 | (16) |
| | | | | | | |
| **කොටසක ඉපයීම** | | | | | | |
| කොටසක ඉපයීම - මූලික (රු.) | 7.83 | 6.73* | 4.83 | 5.51* | 16 | (12) |
| කොටසක ලාභාංශය (රු.) | 2.80 | 8.00 | | | | |

** 2019 මූලික හා ලඝුකරන ලද කොටසක ඉපැයීම, 2020/12/31 ට පැවති කොටස් විභේදනයෙන් පසු බරතැබූ සාමාන්‍යය යොදාගනිමින් කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව පදනම් කරගනිමින් සිදුකරනලදී.*

ඉහත ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 195 හී  විගණනය කරන ලද ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමූහය

| 2020 දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා, | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | අලෙවි සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | සීමිත නියාමන සංචිතය | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| 2020 ජනවාරි 01 දිනට ශේෂය | 1,171,875 | 4,405,581 | (8,025) | (4,406) | (201,867) | 381,156 | 5,744,314 |
| වර්ෂයේ මුළු විස්තීරණ ආදායම | | | | | | | |
| **- වර්ෂය සඳහා වු ලාභය** | **-** | **1,010,228** | **-** | **-** | **-** | **-** | **1,010,228** |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 411,921 | - | - | - | 411,921 |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා | | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (379,095) | - | - | - | (379,095) |
| - ප්‍රතිමිනුම් මත අලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරිම් | - | - | - | (2,119) | - | - | (2,119) |
| වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම | - | - | 32,826 | (2,119) | - | - | 30,707 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | - | 1,010,228 | 32,826 | (2,119) | - | - | 1,040,935 |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා | | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 379,095 | - | 379,095 |
| **හිමිකරුවන් සමග සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | | |
| **- ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| - 2018 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | - | (350,000) | - | - | - | - | (350,000) |
| - 2019 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | | (100,000) | | | | | (100,000) |
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,171,875** | **4,965,809** | **24,801** | **(6,525)** | **177,228** | **381,156** | **6,714,344** |
| 2020 ජනවාරි 01 දිනට ශේෂය | 1,171,875 | 4,965,809 | 24,801 | (6,525) | 177,228 | 381,156 | 6,714,344 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | | |
| - වර්ෂය සඳහා වු ලාභය | **-** | **1,175,223** | **-** | **-** | **-** | **-** | **1,175,223** |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 649,658 | - | - | - | 649,658 |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා | | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (580,705) | - | - | - | (580,705) |
| - ප්‍රතිමිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරිම් | - | - | - | (44,995) | - | - | (44,995) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | **-** | **-** | **68,953** | **(44,995)** | **-** | **-** | **23,958** |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | **-** | **1,175,223** | **68,953** | **(44,995)** | **-** | **-** | **1,199,181** |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා | | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 580,705 | - | 580,705 |
| **හිමිකරුවන් සමග සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| 2020 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | - | (300,000) | - | - | - | - | (300,000) |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,171,875** | **5,841,032** | **93,754** | **(51,520)** | **757,933** | **381,156** | **8,194,230** |

ඉහත හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමූහය , වාර්ෂික වාර්තාවේ පිටු අංක 196 හී ඇති විගණනය කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමාගම

| 2020 දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා, | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | අලෙවි සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | සීමිත නියාමන සංචිතය | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| **2019 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 4,167,660 | 1,451 | (4,395) | (201,867) | 381,156 | 5,515,880 |
| වර්ෂයේ මුළු විස්තීරණ ආදායම | | | | | | | |
| **වර්ෂය සඳහා වූ ලාභය** | - | 826,709 | - | - | - | - | 826,709 |
| **වර්ෂය සඳහා වූ වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මුල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 387,525 | - | - | - | 387,525 |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (379,095) | - | - | - | (379,095) |
| - ප්‍රතිමිනුම් මත අලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | (2,119) | - | - | (2,119) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | 8,430 | (2,119) | - | - | 6,311 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 826,709 | 8,430 | (2,119) | - | - | 833,020 |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිත අරමුදලට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 379,095 | - | 379,095 |
| **හිමිකරුවන් සමඟ සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| 2018 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | - | (350,000) | - | - | - | - | (350,000) |
| 2019 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | | (100,000) | | | - | | (100,000) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 4,544,369 | 9,881 | (6,514) | 177,228 | 381,156 | 6,277,995 |
| **2020 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 4,544,369 | 9,881 | (6,514) | 177,228 | 381,156 | 6,277,995 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | | |
| වර්ෂය සඳහා වු ලාභය | - | 723,945 | - | - | - | - | 723,945 |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මුල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 586,450 | - | - | - | 586,450 |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (580,705) | - | - | - | (580,705) |
| - ප්‍රතිමිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | (27,402) | - | - | (27,402) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | 5,745 | (27,402) | - | - | (21,657) |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 723,945 | 5,745 | (27,402) | - | - | 702,288 |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 580,705 | - | 580,705 |
| **හිමිකරුවන් සමඟ සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| 2020 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | - | (300,000) | - | - | - | - | (300,000) |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 4,968,314 | 15,626 | (33,916) | 757,933 | 381,156 | 7,260,988 |

ඉහත හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමාගම, වාර්ෂික වාර්තාවේ පිටු අංක 197 හී ඇති විගණනය කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා, | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | 2020 | 2019 | 2020 | 2019 |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| බදු පෙර ලාභය | | 1,630,496 | 1,404,891 | 999,363 | 1,106,535 |
| **ගැලපීම්:** | | | | | |
| පොළී ආදායම | | (2,487,950) | (2,243,284) | (2,120,053) | (1,884,977) |
| ලාභාංශ ආදායම | | (5,367) | (5,642) | (5,309) | (64,490) |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | 19,632 | 18,885 | 19,147 | 18,469 |
| දේපල පිරියත හා උපකරණ ක්ෂය | | 54,000 | 47,319 | 38,287 | 32,593 |
| භාවිතයට ඇති කල්බදු වත්කම් අයිතිය ශුද්ධ ක්ෂයවීම | | 130,693 | 139,525 | 115,293 | 126,628 |
| කල්බදු ණයහිමියාගේ පොළී වියදම | | 45,703 | 53,710 | 43,121 | 51,699 |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් | | 47,312 | 37,136 | 26,945 | 21,656 |
| උපලබ්ධි වු ශුද්ධ ලාභ | | (53,634) | (92,856) | (44,909) | (70,000) |
| ශුද්ධ සාධාරණ අගය මත (ලාභ)/අලාභ | | (17,696) | 8,826 | (12,987) | 6,370 |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් ලාභ | | (3,339) | (4,283) | (3,242) | 403 |
| භාවිතයට ඇති කල්බදු වත්කම් බැහැර කිරීමෙන් ලද ලාභය | | (234) | - | (475) | - |
| | | (640,384) | (635,773) | (944,819) | (655,114) |
| මෙහෙයුම් වත්කම් වල ශුද්ධ වෙනස | (අ) | (362,064) | (558,137) | (48,747) | (219,553) |
| මෙහෙයුම් වගකීම් වල ශුද්ධ වෙනස | (ආ) | 3,447,285 | 2,898,914 | 2,791,079 | 2,380,061 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ | | 2,444,837 | 1,705,004 | 1,797,513 | 1,505,394 |
| ගෙවු පාරිතෝෂිකය | | (4,987) | (12,493) | (3,694) | (8,539) |
| ආර්ථික සේවා ගාස්තු | | (6,137) | (22,205) | - | - |
| ගෙවු ආදායම් බදු | | (73,109) | - | | |
| අතුරු සමාගම් ලාභාංශ සඳහා රඳවා ගැනීමේ බද්ද | | - | (9,575) | | |
| ගෙවු ප්‍රාග්ධන ලාභ බදු | | (1,213) | (814) | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වු ශුද්ධ මුදල් ප්‍රවාහ | | 2,359,391 | 1,659,917 | 1,793,819 | 1,496,855 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ආයෝජන සුරැකුම් මිලදී ගැනුම් | | (161,539,857) | (135,558,700) | (112,016,270) | (97,671,001) |
| මූල්‍ය ආයෝජන වල කල්පිරීමෙන් ලද මුදල් | | 156,827,276 | 130,618,738 | 108,179,859 | 93,759,085 |
| මූල්‍ය ආයෝජන විකිණීමෙන් ලද මුදල් | | 391,770 | 1,684,919 | 301,267 | 1,173,551 |
| ලද පොළී | | 2,372,238 | 2,377,621 | 2,001,689 | 1,976,793 |
| ලද ලාභාංශ | | 5,367 | 5,933 | 5,309 | 64,750 |
| අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනුම් | | (36,703) | (9,585) | (31,557) | (9,517) |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනුම් | | (77,408) | (59,965) | (59,114) | (40,469) |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් සඳහා ලද මුදල් | | 19,330 | 6,117 | 18,531 | 758 |
| කල්බදු වත්කම් භාවිතා කිරීමේ අයිතිය සඳහා ගෙවු අත්තිකාරම් | | (8,487) | (30,363) | (8,487) | (22,587) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදා ගත් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (2,046,474) | (965,285) | (1,608,773) | (768,637) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ලාභාංශ ගෙවීම් | | (300,000) | (450,000) | (300,000) | (450,000) |
| කල්බදු වගකීම් ගෙවීම් | | (161,318) | (148,520) | (147,090) | (136,481) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදා ගත් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (461,318) | (598,520) | (447,090) | (586,481) |
| **මුදල් සහ මුදල් වලට සමාන වත්කම් වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම** | | (148,401) | 96,112 | (262,044) | 141,737 |
| වසර මුල මුදල් සහ මුදල් වලට සමාන වත්කම් | | 735,207 | 639,095 | 601,662 | 459,925 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් වලට සමාන වත්කම්** | | 586,806 | 735,207 | 339,618 | 601,662 |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ සටහන්**

| | | | | |
|---|---|---|---|---|
| **(අ) මෙහෙයුම් වත්කම් වල වෙනස** | | | | |
| විලම්භිත වියදම් වල අඩුවීම්/(වැඩිවීම්) | (24,997) | 1,864 | - | - |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය වල වැඩි වීම් | (54,429) | (82,194) | (54,429) | (82,194) |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වල අඩුවීම්/(වැඩිවීම්) | (126,365) | (229,638) | (27,984) | (68,789) |
| ලැබිය යුතු රක්ෂණ වාරිකයන්හී වැඩිවීම් | (164,944) | (148,437) | 4,470 | (1,412) |
| මුළු වෙනත් වත්කම් වල අඩුවීම්/(වැඩිවීම්) | 8,671 | (99,732) | 29,196 | (67,158) |
| **මෙහෙයුම් වත්කම් වල ශුද්ධ වෙනස** | (362,064) | (558,137) | (48,747) | (219,553) |
| **(ආ) මෙහෙයුම් වගකීම් වල වෙනස** | | | | |
| අනෙකුත් වගකීම් වල වැඩි වීම් | 254,418 | 177,265 | 29,633 | 166,649 |
| රක්ෂණ ප්‍රතිපාදන – ජීවිත රක්ෂණ වල වැඩි වීම් - බදු පෙර | 2,595,681 | 2,204,529 | 2,595,681 | 2,204,529 |
| රක්ෂණ ප්‍රතිපාදන – සාමාන්‍ය රක්ෂණ වල වැඩි වීම් | 437,733 | 346,321 | - | - |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ – වැඩි වීම් | 159,453 | 170,799 | 165,765 | 8,883 |
| **මෙහෙයුම් වගකීම් වල ශුද්ධ වෙනස** | 3,447,285 | 2,898,914 | 2,791,079 | 2,380,061 |

ඉහත මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 198 හී ඇති විගණනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණී.